දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක : 21 / 2012 මගේ අංකය:- එස්ඩබ්ලිව්ඩී/5/නිනි /2012

බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09

2012.07.25

**මූලස්ථාන අධිකාරී/ බන්ධනාගාර අධිකාරී / සහකාර අධිකාරීවරුන් වෙත**

**බන්ධනාගාර නිල නිවාසවල විදුලි හා ජල බිල්පත් අයකිරීම සංශෝධණය කිරීම**

මාගේ ප්‍රධානත්වයෙන් 2012/07/25 වන දින බන්ධනාගාර මූලස්ථාන ශ්‍රවනාගාරයේදී පැවැත්වූ විදුලි හා ජල කළමණාකරන රැස්වීමේදී බන්ධනාගාර නිලධාරීන් පදිංචිව සිටින විදුලි හා ජල මීටර් සවිකර නොමැති නිල නිවාසවලින් දැනට අයකරණ නාමික මුදල විදුලි පරිභෝජන තත්වය සමග සසදා බැලීමේදී කිසිසේත් ප්‍රමාණවත් නොවනවා පමණක් නොව එය සාධාරණ නොවන බැවින් ජල හා විදුලි මීටර් සවිකර නොමැති නිල නිවාසවලින් 2012 අගෝස්තු 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විදුලි හා ජල බිල්පත් පහත සදහන් ආකාරයට සංශෝධනය කර අයකිරීමට තීරණය කර ඇත.

**විදුලි බිල්පත් සංශෝධණය**

01 පේලි නිල නිවාස (නියාමක/ඕවරසියර් හා යටත් ශ්‍රේණි) රු: 400 00 ( මාසිකව)
02 තට්ටු නිල නිවාස ( - එම - ) රු: 700 00 (මාසිකව)
03 තනි නිල නිවාස තනතුරු අනුව(11 පෙල ජේලර් හා සුභ සාධක) රු: 700 00 ( මාසිකව)
04 තනි නිල නිවාස තනතුරු අනුව ( 1 පෙ ජේලර් හා සුභ සාධක) රු: 800 00 (මාසිකව)
05 සහකාර අධිකාරී හා වෛද්‍ය නිල නිවාස රු: 1000 00 ( මාසිකව)
06 අධිකාරී සහ කොමසාරිස්වරුවන් රු: 1100 00 (මාසිකව)
07 වායු සමීකරණ යන්ත්‍ර භාවිතා කරණ නිල නිවාස වල පදිංචි කරුවෙකුගෙන් ( මාසිකව) එක් වායු සමීකරණ යන්ත්‍රයකට රු: 1000 /- බැගින් **අමතර විදුලි ගාස්තුවක්** අයකල යුතුය,

**ජල බිල්පත් සංශෝධණය**

01. ජල බිල්පත් සදහා පේලි නිල නිවාසයකින් මසකට රුපියල් 100/- ක මුදලක් ද, අනිකුත් සියළුම නිවාස වලින් මසකට රු:150/- ක මුදලක් ද අයකිරීමට තීරණය කර ඇත.
මෙම සංශෝධන අයකිරීම් 2012 08 01 දින සිට බලපවත්වන අතර එම මාසයේ සිට වැටුපෙන් අයකර ගැනීමට ක්‍රියා කරණ ලෙස මෙයින් දන්වමි.

පී . ඩබ්ලිව් . කොඩිප්පිලි
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්